**රාජ්‍ය මුද්‍රණ සංස්ථාව - 2018**
**-----------------------------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**
**---------------------------------**

රාජ්‍ය මුද්‍රණ සංස්ථාවේ ("සංස්ථාව") 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර සංස්ථාවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**
**---------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් කළමණාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**
**----------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමණාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමණාකරණයේ වගකීමක් වන අතර, කළමණාකාරීත්වය සංස්ථාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමණාකරණයේ වගකීමකි.

සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සංස්ථාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-----------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇති වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදු වන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදු කරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් හඳුනා නොගැනීම මඟින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සංස්ථාවේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමණාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තු වල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර , එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුවේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබාගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සංස්ථාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පටිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පටිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව සංස්ථාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂමව සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූල නොවීම.

| අදාල ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම. | කළමණාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 01 | | |
| ප්‍රමිතියෙහි 79 (ආ) ඡේදය ප්‍රකාරව ප්‍රාග්ධනය තුළ ඇතුළත් සංචිතයන්ගේ ස්වභාවය, පවත්වාගෙන යාමේ අරමුණු ආදිය පිළිබඳව හෙළිදරව් කිරීම අවශ්‍ය වුවද සංස්ථාව විසින් පවත්වාගෙන යනු ලබන රු. 102,491ක් වූ ප්‍රාග්ධන සංචිතය, රු. 1,000,000 ක් වූ පොදු සංචිතය, රු. 13,901,142ක් වූ සංවර්ධන සංචිතය හා රු.808,011,707ක ප්‍රත්‍යාගණන සංචිත පිළිබඳව හෙළිදරව් කිරීම් සිදු කර නොතිබුණි. | සංස්ථාව ආරම්භක අවස්ථාවේදී මෙම සංචිතය පිහිටුවා ඇති අතර අවසන් ගිණුම් වල මෙය ප්‍රමාණවත් පරිදි සටහනක් ලෙස යොදා ඇත. | ප්‍රමිතියේ දක්වා ඇති පරිදි සංචිතයේ ස්වභාවය, අරමුණු ආදිය පිළිබඳව හෙළිදරව් කිරීම් සිදුකළ යුතුය. |
| (ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 07 | | |
| • සමාලෝචිත වර්ෂයේ මුදල් හා මුදල් සමාන දෑ හි ආරම්භක ශේෂය රු. 15,643,749 ක් වුවද එය රු. 15,801,749 ක් ලෙස යොදා මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුළනය කර තිබුණි. | පසුගිය වර්ෂයේ සේවක පුහුණුව සඳහා වැයවූ රු. 158,000 ක මුදල නීත්‍යානුකූල නොවීම හේතුවෙන් සේවකයන්ගෙන් නැවත අයකිරීම නිසා මෙම තත්ත්වය ඇති වී ඇත. | ප්‍රමිතියේ දක්වා ඇති පරිදි මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කළ යුතුය. |

| | | |
|---|---|---|
| • සමාලෝචිත වර්ෂයේ ජංගම වගකීම් හි වැඩිවීම රු. 8,078,063 ක් වූ නමුදු මුදල් ප්‍රවාහ ප්‍රකාශයේදි රු. 40,133 ක් අඩුවෙන් එම වැඩිවීම හඳුනාගෙන තිබුණි. | | |

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 23

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී මිලදී ගන්නා ලද ලොතරැයි මුද්‍රණ යන්ත්‍රය වෙනුවෙන් ලබාගත් ණය මුදල සඳහා ගෙවන ලද පොලිය හඳුනාගෙන ප්‍රමිතියේ 09 ඡේදයේ පරිදි ප්‍රාග්ධනිත කළ යුතු වුවද එසේ ප්‍රාග්ධනිත කර නොතිබුණි. | 2018 වර්ෂයේ මුල් කාර්තුව දක්වා දරන ලද පොලී වියදම් ප්‍රාග්ධනිත කර ඇත. | සංස්ථාව විසින් පිළියෙල කර විගණනයට ලබාදුන් ලේඛන අනුව පොලී වියදම් එහි අඩංගු වී නැත. එබැවින් ප්‍රමිතිය අනුව ක්‍රියා කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමණාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 32,987,997 ක් වූ මුදල් හා බැංකු ශේෂවලට තවත් ගිණුමක වූ රු. 5,434,426 ක අයිරා ශේෂය හිලව් කර ශුද්ධ ශේෂය වන රු. 27,553,571 පමණක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ මුදල් හා මුදල් සමාන දෑ යටතේ දැක්වීම නිසා බැංකු අයිරාව හා මුදල් හා මුදල් සමාන දෑ රු. 5,434,426 ක් අඩුවෙන් හෙළිදරව් කර තිබුණි. | අදහස් දක්වා නැත. | මෙම ගිණුම්කරණ දෝෂය ඊළඟ වර්ෂයේ අවසාන ගිණුම් පිළියෙල කිරීමේදී නිවැරදි කළ යුතුය. |
| (ආ) පසුගිය වර්ෂයේ රු. 91,924,671 ක් වටිනා අවසාන අමුද්‍රව්‍ය තොගය සමාලෝචිත වර්ෂයේදී සදොස් ලෙස රු. 93,911,088 ලෙස ඉදිරියට ගෙන ඒම නිසා රු. 1,986,417 කින් සමාලෝචිත වර්ෂයේ ශුද්ධ අලාභය වැඩියෙන් දක්වා තිබුණි. | අදහස් දක්වා නැත. | මෙම ගිණුම්කරණ දෝෂය ඊළඟ වර්ෂයේ අවසාන ගිණුම් පිළියෙල කිරීමේදී නිවැරදි කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඈ) පසුගිය වර්ෂයේ රු. 34,351,421 ක් වටිනා අවසාන අමතර කොටස් තොගය සමාලෝචිත වර්ෂයේදී සදොස් ලෙස රු. 32,856,421 ක් ලෙස ඉදිරියට ගෙන ඒම නිසා සමාලෝචිත වර්ෂයේ ශුද්ධ අලාභය රු. 1,495,000 කින් අඩුවෙන් දක්වා තිබුණි. | අදහස් දක්වා නැත. | මෙම ගිණුම්කරණ දෝෂය ඊළඟ වර්ෂයේ අවසාන ගිණුම් පිළියෙල කිරීමේදී නිවැරදි කළ යුතුය. |

### 1.5.3 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමණාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) වර්ෂ 06 ක් හා ඊට වැඩි එකතුව රු. 110,854,132 ක් වූ වෙළඳ ණයගැති ශේෂයක් අයකර ගැනීමට සංස්ථාව අපොහොසත් වී තිබුණු අතර එය සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු ණයගැති ශේෂය වූ රු. 326,777,812 කින් සියයට 34 ක් විය. | පැරණි ණය අයකර ගැනීමට නීති අංශය, මුදල් අංශය හා අලෙවි අංශය එක්ව ක්‍රියා කරයි. | පැරණි ණය ශේෂ නොපමාව අයකර ගැනීමට වැඩ පිළිවෙලක් යෙදිය යුතුය. |
| (ආ) සමාලෝචිත වර්ෂය අවසානයට ජාතික කඩදාසි සමාගමෙන් සංස්ථාව වෙත රු. 9,753,427 ක් අයවීමට තිබූ අතර සංස්ථාව විසින් කඩදාසි සමාගමට ගෙවිය යුතු මුදල රු. 7,460,675 ක් වී තිබුණි. මෙම ශේෂ තුළ අවුරුදු 05 ඉක්ම වූ ණය මුදල පිළිවෙලින් රු. 7,989,976 ක් සහ රු. 5,578,142 ක් වූ නමුත් මෙම ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. කඩදාසි සමාගමේ ව්‍යාපාර කටයුතු නතරවීම නිසා මෙම ශේෂ නිරවුල් කිරීම පිළිබඳ අවිනිශ්චිතතාවයක් නිරික්ෂණය කෙරේ. | සංස්ථාව වෙත ලබාගත යුතු මුදල් ලබා ගැනීම සඳහා ජාතික කඩදාසි සමාගමේ නිසි බලධාරියා වෙත නැවත වරක් සිහි කැඳවීම් කිරීමට කටයුතු කරනු ලැබේ. | මෙම ශේෂ කඩිනමින් නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවෙන් රු. 11,836,110 ක් ලැබිය යුතු බවට සංස්ථාවේ ගිණුම් වල දක්වා තිබුණද ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් එම ශේෂය තහවුරු කර හෝ ප්‍රතික්ෂේප කර නොතිබුණි. ඒ අනුව මෙම ශේෂයේ නිවැරදිතාවය පිළිබඳව අවිනිශ්චිතතාවයක් නිරීක්ෂණය විය. | ඉදිරියේදී නිවැරදි කරනු ලැබේ. | සංස්ථාවේ ගිණුම් වල දැක්වෙන ශේෂයන් සහ ශේෂ සනාථ ලිපි මඟින් ලබාගන්නා ලද ශේෂයන් පරීක්ෂා කර සංස්ථාවේ ගිණුම් වල යම් වෙනස්කම් කිරීම සුදුසු නම් අවශ්‍ය වෙනස්කම් කළ යුතුය. |

**1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමණාකරණ තීරණ ආදියට අනුකූල නොවීම.**

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් | කළමණාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2015 මැයි 25 දිනැති අංක PED 1/2015 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛයේ 4.2 වගන්තිය | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව සංස්ථාවේ මධ්‍යම මට්ටමේ කළමනාකරුවන් 15 දෙනෙකු සඳහා කණ්ඩායම් ප්‍රවාහන සේවය සැපයීමට කටයුතු නොකර එක් අයෙකුට මාසිකව රු. 17,500 ක් බැගින් සමාලෝචිත වර්ෂයේ රු. 3,132,500 ක දීමනා ගෙවා තිබුණි. | ද්‍රවශීලතාවය යහපත් අතට හැරුණු විට ප්‍රමාණවත් වාහන සංඛ්‍යාවක් යොදවාගෙන චක්‍රලේඛයට අනුකූලව ප්‍රවාහන පහසුකම් සැපයීමට කටයුතු කරනු ලැබේ. | අදාළ චක්‍රලේඛයට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ආ) 1942 අංක 45 දරන කර්මාන්තශාලා ආඥා පනතේ 41 වගන්තිය | ගිනි අනතුරු ඇඟවීමේ සංඥා පද්ධතියක් ස්ථාපිතකර නොතිබුණි. | පද්ධතියක් සවිකිරීමට කටයුතු කරනු ලැබේ. | අදාළ නීතිය අනුව කටයුතු කළ යුතුය. |

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 406,985,154 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 243,094,833 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 163,890,321 ක ඌනතාවයේ වැඩි වීමක් නිරීක්ෂණය විය. ඉකුත් වර්ෂය හා සැසඳීමේදී පාසල් පෙළ පොත් මුද්‍රණ ආදායම රු. 388,013,361 කින් අඩුවීම ඉහත මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

### 2.2 අනුපාත විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයට පෙර වර්ෂයේදී 1 : 0.87 ක් වූ ජංගම අනුපාතය සමාලෝචිත වර්ෂයේදී 1 : 0.75 ක් දක්වා පිරිහී තිබූ අතර ක්ෂණික අනුපාතයද 1 : 0.62 සිට 1 : 0.34 දක්වා පිරිහී තිබුණි. තවද සමාලෝචිත වර්ෂයට පෙර වර්ෂයේ පිළිවෙලින් සියයට 14.5 ක් වූ දළ ලාභ අනුපාතය සහ සියයට (19.5) ක් වූ ශුද්ධ ලාභ අනුපාතය සමාලෝචිත වර්ෂයේදී පිළිවෙලින් සියයට (0.30) ක් සහ සියයට (45) ක් ලෙස පිරිහී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමණාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමණාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ලොතරැයි මණ්ඩලය සමග ඇති කරගත් ගිවිසුම ප්‍රකාරව ලොතරැයි මුද්‍රණය කර නියමිත දිනට භාර නොදීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී ලොතරැයි මණ්ඩලය විසින් ගෙවිය යුතු මුදලින් රු. 10,181,000 ක් දඩ වශයෙන් අඩු කර ගෙන තිබුණි. | සංස්ථාවේ පවතින මූල්‍ය දුෂ්කරතාවය හේතුවෙන් ලොතරැයි මුද්‍රණයට අවශ්‍ය අමුද්‍රව්‍ය නියමිත වේලාවට ගෙන්වා ගැනීමට නොහැකි වීම නිසා මේ තත්වයට හේතු වී ඇත. | කලට වේලාවට අමුද්‍රව්‍ය ලබාගෙන එකඟ වූ දිනයන්ට ඇණවුම් ලබා දීමට කටයුතු කළ යුතුය. |
| (ආ) 2019 වර්ෂය සඳහා පාසල් පෙළපොත් මුද්‍රණය කර භාර දීම සඳහා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව සමඟ ඇති කරගත් ගිවිසුම ප්‍රකාරව දින 01 සිට දින 26 දක්වා කාල ප්‍රමාදයකින් මුද්‍රණය කරන ලද පාසල් පොත් භාර දීම හේතුවෙන් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් | එවකට රටේ ඇති වූ දේශපාලන අස්ථාවරභාවය හේතුවෙන් එදින සිට මාස 04 කට වැඩි කාලයක් සංස්ථාවේ සභාපතිවරයෙකු හෝ අධ්‍යක්ෂ මණ්ඩලයක් නොමැති වීම මත ප්‍රසම්පාදන කමිටුවක් නොමැති වීමෙන් පෙළපොත් සඳහා අවශ්‍ය කඩදාසි ආනයනය හා වෙනත් අමුද්‍රව්‍ය ආනයනය කිරීමේ ගැටළු රාශියක් පැනනැගුණි. එසේම | පාසල් පෙළපොත් මුද්‍රණ ආදායම සංස්ථාවේ ආදායම් ලබන ප්‍රධාන මූලාශ්‍රයකි. එබැවින් අවශ්‍ය අමුද්‍රව්‍ය ගබඩා කර නිසි වේලාවට මුද්‍රණ ඇණවුම ඉටුකර භාරදීම කළ යුතුය. |

| | | |
|---|---|---|
| සංස්ථාවට ගෙවිය යුතු මුදලින් රු. 38,262,345 ක් ප්‍රමාද ගාස්තු වශයෙන් අය කර ගෙන තිබුණි. | සංස්ථාවේ පවතින මූල්‍ය දුෂ්කරතාවයද මෙයට බලපෑ අතර මෙම කරුණු මත පෙළපොත් සඳහා ප්‍රමාද ගාස්තු ගෙවීමට සිදු විය. | |
| (ඇ) සංස්ථාව විසින් ලොතරැයි මුද්‍රණය සඳහා 2017 වර්ෂයේදී මිලදී ගත් යන්ත්‍රයේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් සම්පූර්ණයෙන්ම තෘප්තිමත් වන බව 2017 නොවැම්බර් 20 දින සාමාන්‍යාධිකාරී විසින් සැපයුම්කරු වෙත දැනුම් දී තිබුණි. එසේ වුවද 2018 පෙබරවාරි මස සිට 2018 නොවැම්බර් 30 දක්වා කාලපරිච්ඡේදය තුළදී මෙම යන්ත්‍රයේ Flexo කොටසේ පැය 336 ක් හා Variable Data Printing කොටසේ යන්ත්‍ර පැය 166 ක් ක්‍රියාවිරහිත වී තිබුණි. | පිළිතුරු ලබා දී නැත. | තාක්ෂණික ඇගයීම් කමිටුවේ නොසැලකිලිමත්කමක් හෝ යන්ත්‍ර ක්‍රියාකරුවන්ගේ නොසැලකිලිමත්කමක් නිසා මෙම තත්ත්වය පැන නැගී ද යන්න නිශ්චිතව තීරණය කර වගකීම අදාළ පාර්ශවය වෙත පැවරිය යුතුය. |
| (ඈ) 2018 වර්ෂයේදී දිනුම් අදින ලද අංක 3665 දරන මහජන සම්පත ලොතරැයියේ ටිකට්පත් 1,125,000 ක වර්ෂය දෝෂ සහිතව 2018 වෙනුවට 2008 යනුවෙන් සටහන් කිරීම නිසා ඉවත් කිරීමට සිදුවී තිබුණි. ඒ වෙනුවෙන් වැය කරන ලද රු. 354,477 ක මුදල අනාර්ථික වියදමක් බවට පත්ව තිබුණි. | පිළිතුරු ලබා දී නැත. | වගකිව යුතු අයගෙන් අලාභය අයකර ගැනීම. මෙවැනි වැරදි ඇති නොවීම පිණිස විධිවිධාන යෙදීම. |
| (ඉ) සංස්ථාව සතු පාදුක්ක පානළුවේ පිහිටි ඉඩමෙන් තක්සේරු වටිනාකම රු. 107,000,000 ක් වූ අක්කර 13 රූඩ් 01 පර්චස් 20 ක ප්‍රමාණය කර්මාන්ත පුරයක් ඇති කිරීම සඳහා 2000 වර්ෂයේදී කාර්මික සංවර්ධන මණ්ඩලයට පවරා දී තිබූ මුත් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අදාළ මුදල ලබාගෙන ඉඩම නීත්‍යානුකූලව බැහැර කිරීමට කටයුතු කර නොතිබුණි. | රජයේ තක්සේරුව වූ රු. මිලියන 107 කට විකිණීමට මේ වන විට අමාත්‍ය මණ්ඩල සංදේශයක් අප සංස්ථාව විසින් ඉදිරිපත් කර ඇත. ඒ අනුව ඉදිරියේදී එම තීරණ අනුව කටයුතු කරනු ලැබේ. | 2019 අගෝස්තු 09 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීමේදී රු. මිලියන 25 ප්‍රතිෂ්ඨාවකට මෙම ගණුදෙනුව හමාර කිරීමට නියෝගයක් ලබාදී ඇත. ඒ අනුව කටයුතු කල යුතුය. |

## 3.2 ප්‍රසම්පාදන කළමණාකරණය

| විගණන නිරීක්ෂණය | කළමණාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) රු. 203,509,234 ක් වැය කර මිලදී ගත් ලොතරැයි මුද්‍රණ යන්ත්‍රයට අදාළ මුරපද (password) යන්ත්‍ර නිෂ්පාදන ආයතනයෙන් ලබා ගැනීමට සංස්ථාව කටයුතු කර නොතිබීම නිසා යන්ත්‍රයට මෘදුකාංග ඇතුළත් කිරීමේදී නිෂ්පාදක ඉන්දියානු සමාගම මත කටයුතු කිරීමට සිදු වී තිබුණි. තවද යන්ත්‍රයේ වගකීම් කාලය සමාලෝචිත වර්ෂයේ නොවැම්බර් 20 දින අවසන් වී තිබූ නමුදු සංස්ථාව නිෂ්පාදකගේ දේශීය නියෝජිතයා සමඟ වාර්ෂික නඩත්තු ගිවිසුමකට එළඹී නොතිබුණි. | අප අමාත්‍යාංශය නියෝජිත ආයතනය සමඟ සම්බන්ධීකරණය කරමින් මෙය සිදු කිරීමට මේ වන විට සාකච්ඡා කරනු ලබන අතර එහි තීරණ අනුව කටයුතු කරනු ලැබේ. | අදාළ මුරපද ලබා ගැනීමට කඩිනමින් ක්‍රියා කළ යුතුය. දේශීය නියෝජිතයා සමඟ වාර්ෂික නඩත්තු ගිවිසුමකටද එළඹිය යුතුය. |
| (ආ) ලොතරැයි මුද්‍රණ යන්ත්‍රයේ ක්‍රියාකාරීත්වය සඳහා වාර්ෂික Flexo ටේප් රෝල් අවශ්‍යතාවය රෝල් 5ක් වූ මුත් එය නොසලකා රු. 3,115,200 ක් වැය කර 2017 වර්ෂයේදී ටේප් රෝල් 66 ක් මිලදී ගෙන තිබුණි. එයින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට එකතු වටිනාකම රු. 2,879,200 ක් වූ ටේප් රෝල් 61 ක් ගබඩාවේ ඉතිරිව තිබූ අතර ඒවා කල් ඉකුත් වී තිබුණි. | අදාළ අයිතමය සම්බන්ධයෙන් මූලික ප්‍රායෝගික දැනුමක් නොමැති නිසා එය ඉදිරියේදී ප්‍රයෝජනයට ගැනීමට නියමිතය. | ගබඩාවේ ඉතිරිවූ ටේප් රෝල් 61 කල් ඉකුත් වී ඇති බැවින් ඒවා භාවිතා කිරීමට නොහැකි වේ. ද්‍රව්‍ය ඇණවුම් කිරීමේදී වාර්ෂික අවශ්‍යතාවය සැලකිල්ලට ගත යුතුය. |

## 3.3 මානව සම්පත් කළමණාකරණය

| විගණන නිරීක්ෂණය | කළමණාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සංස්ථාවේ අනුමත කාර්ය මණ්ඩලය 2012 වර්ෂයේදී සකස් කරන ලද්දක් වූ අතර වර්තමානයේදී සංස්ථාව මිලදී ගත් යන්ත්‍රෝපකරණ හා සංස්ථාවේ නිෂ්පාදන ක්‍රියාවලිය සැලකිල්ලට | සංස්ථාව මිලදීගත් යන්ත්‍ර උපකරණ හා සංස්ථාවේ නිෂ්පාදන ක්‍රියාවලිය සැලකිල්ලට ලක් කරමින් අවශ්‍යතාවය අනුව කාර්යමණ්ඩලය සංශෝධනය කර ගැනීමේ කටයුතු මේ වන විට නිම කරමින් පවතින | මුද්‍රණ කර්මාන්තය තාක්ෂණය සමඟ ශීඝ්‍රයෙන් වෙනස්වන කර්මාන්තයකි. නව මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වන්නේ සාපේක්ෂව අවම සේවක සංඛ්‍යාවකි. සංස්ථාව මෙම වර්ෂයේදීද |

| | | | |
|---|---|---|---|
| | ගනිමින් අවශ්‍යතාවය අනුව කාර්යමණ්ඩලය (Cadre Assessment) සංශෝධනය කර ගැනීම කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි. | අතර ඉදිරි මස ඇතුළත මෙම කටයුතු නිම කර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට කටයුතු කෙරේ. | නව මුද්‍රණ යන්ත්‍ර මිලදී ගැනීමට සැලසුම් කර ඇති නිසාත්, දැනට පවතින යන්ත්‍රවල කාර්යක්ෂමතාවයද සැලකිල්ලට ගෙන කාර්යමණ්ඩලයේ අවශ්‍යතාවය තීරණය කළ යුතුය. |
| (ආ) | සංස්ථාවේ බඳවා ගැනීමේ පටිපාටියේ 5.4 ඡේදය පරිදි අභ්‍යන්තර අයදුම්කරුවකු තෝරා ගැනීමේදී අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය මත අයදුම්පත් කැඳවා තරඟ විභාගයක හෝ/සහ විධිමත් සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත තෝරා ගැනීම සිදු කළ යුතු වුවද, එම බඳවා ගැනීමේ පටිපාටිය උල්ලංඝනය කරමින් ගණකාධිකාරි තනතුරට 2012 වර්ෂයේ දී සිට එවකට සිටි සහකාර ගණකාධිකාරි පත් කර තිබුණි. | මීළඟ අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කර එහි තීරණය අනුව කටයුතු කරනු ලැබේ. | සංස්ථාවේ බඳවා ගැනීමේ පටිපාටිය අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) | මානව සම්පත් කළමණාකරු සේවයෙන් ඉවත් වීම නිසා 2018 නොවැම්බර් 01 දින සිට විගණන දින වන 2019 ජූනි 21 දක්වා මානව සම්පත් කළමණාකරු තනතුර පුරප්පාඩුව පැවතුණි. අධ්‍යාපන අමාත්‍යාංශයේ සහකාර ලේකම්වරයෙකු එම තනතුරේ රාජකාරී ආවරණය සඳහා පත්කර තිබුණි. | පිළිතුරු ලබාදී නැත. | සංස්ථාවේ 700 කට ආසන්න කාර්ය මණ්ඩලයක් සිටින නිසාත් මෙය අනුමත තනතුරක් නිසාත් පූර්ණ කාලීන මානව සම්පත් කළමණාකරුවෙකු බඳවා ගත යුතුය |